**රණවිරු සේවා අධිකාරිය - 2023**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

රණවිරු සේවා අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන , ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර රණවිරු සේවා අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන
පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත අංක 06 හි 08 වන වගන්තියට අනුව, ශේෂ පත්‍ර දිනට පසු සිදු වීම් ප්‍රතිරූපණය වන පරිදි අස්ථිත්වය විසින් මූල්‍ය ප්‍රකාශන වල හඳුනා ගන්නා ලද අගයන් වෙනස් කල යුතු වුවත්, 2023 වර්ෂයට අදාළ රු.594,500 ක් වූ වියදම ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් අදාළ වියදම හා ගෙවිය යුතු වියදම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | දෘශ්‍යාබාධිත රණවිරුවන් වෙත ලබා දීම සඳහා ජේ.එම් වික්‍රමාරච්චි සමාගමෙන් ඇස් කණ්නාඩි ඇණවුම් කරන ලදි. අදාල ඇණවුම සඳහා චෙක්පත අත්සන් කර තිබූ අතර, එම චෙක්පත සැපයුම්කරු වෙත නිකුත් කිරීමට පෙර රණවිරුවන් විසින් ලබා ගන්නා ලද ඇස් කණ්නාඩි දෝධ සහිත බව වාර්තා කිරීම නිසා අදාළ චෙක්පත සැපයුම්කරු වෙත නිකුත් නොකරන ලදී. එබැවින් එම මුදල ගෙවිය යුතු වියදමක් ලෙස මූල්‍ය ප්‍රකාශන තුල ගිණුම් ගත නොකරන ලද බව දන්වා තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව ගිණුම් පිළියෙල කළ යුතු වීම. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඉදිරි වර්ෂ තුනකදී භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු රු.195,886,789 ක් ජංගම නොවන බැරකම් ලෙස ගිණුම්ගත නොකර ප්‍රාග්ධන දායක ගිණුමට බැර කර තිබුණි. | 2021 වර්ෂයේ දී නිවාස සහ ස්වයං රැකියා ණය ලබා දීම සඳහා දුන් රු, 280,250,000 වන ප්‍රාග්ධන ප්‍රධාන ප්‍රාග්ධන දායකය ගිණුමේ ලැබීමක් ලෙසද 2021 සහ 2022 වර්ෂයන්ට අදාලව ප්‍රතිපූරණය කරන ලද මුදල් රු. මිලියන 85.36 රජයේ ප්‍රාග්ධන දායකය ගිණුමෙන් ඉවත් කිරීමක් ලෙස සටහන් කළ අතර, රජයේ ප්‍රාග්ධන දායක ගිණුම ජංගම නොවන වගකීමක් ලෙස ශේෂ පත්‍රයේ සඳහන් කර ඇති බව දන්වා තිබුණි. | මූල්‍ය තොරතුරු නිවැරදිව අනාවරණය කළ යුතු වීම. |
| (ආ)සමාලෝචිත වර්ෂයට අදාළ රු.159,900 ක මෝටර් රථ අළුත්වැඩියා වියදම උපචිත වියදම් ලෙස ගිණුම් ගත නොකිරීම නිසා වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් නිරූපණය විය. | මේ වැනි අඩුපාඩු ඇති නොවන ආකාරයෙන් කටයුතු කරන ලෙසට අදාළ නිලධාරීන් දැනුවත් කරන ලද බව දන්වා තිබුණි. | වර්ෂයට අදාළ උපචිත වියදම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ඇ) සමාලෝචිත වර්ෂයේ අවසන් තොගය රු.192,470 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණු බැවින් අධිකාරියේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් සටහන් වී තිබුණි. | මේ වැනි අඩුපාඩු ඇති නොවන ආකාරයෙන් කටයුතු කරන ලෙසට අදාළ නිලධාරීන් දැනුවත් කරන ලද බව දන්වා තිබුණි. | අවසාන තොගය ඇගයීම හා ගිණුම් තැබීම නිවැරදිව සිදු විය යුතු වීම. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රණවිරු මාපිය රැකවරණ දීමනා ක්‍රමය යටතේ 2016 ජූනි සිට 2017 නොවැම්බර් දක්වා මාස 18 ක කාලය තුල අවිධිමත් ලෙස ගෙවන ලද රු.4,978,580 ක මුදල ප්‍රවර්ථන වර්ෂය අවසන් වන විටත් අයකර ගෙන නොතිබුණි. | අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙම අක්‍රමිකතාවය පිළිබඳව විමර්ශන කටයුතු සිදු කරගෙන යනු ලැබේ. මෙම අක්‍රමිකතාවය පිළිබඳව මුදල් රෙගුලාසි 104 යටතේ පරීක්ෂණයක් පැවැත්වීම සඳහා කමිටුවක් පත් කරන ලද අතර, මේවන විට පරීක්ෂණයෙන් සියයට 25ක පමණ ප්‍රමාණයක් අවසන් කර ඇති බව දැනුම් දී තිබුණි. | අක්‍රමිකතාවයට අදාල පරීක්ෂණ කඩිනම්කර මුදල් ආපසු අයකර ගත යුතු වීම. |

### 1.6.2 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 වර්ෂයේදී කොළඹ දිස්ත්‍රික්කයේ රණවිරු කාන්තා බලකාය පිහිටුවීම සඳහා නිළධාරීන් දෙදෙනකු වෙත ගෙවන ලද රු.1,830,450 ක් වූ අත්තිකාරම් මුදල සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල්කර නොතිබුණි. | අත්තිකාරම් ලබාදීම සම්බන්ධව අභ්‍යන්තර විනය පරීක්ෂණ දෙකක් පවත්වන ලද අතර, එමගින් අදාළ චූදිත නිලධාරීන් නිදහස් කර ඇත. කළමනාකරණ මණ්ඩලයේ උපදෙස් පරිදි මුදල් රෙගුලාසි 104 යටතේ පරීක්ෂණයක් සිදු කිරීමට 2023.08.15 දින පත්කළ කමිටුව පරීක්ෂණ කටයුතු සිදු කරනු ලබන බව දන්වා තිබුණි. | අදාල අත්තිකාරම් මුදල් ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 1.7 සම්බන්ධිත පාර්ශවයන් හා සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හෙළිදරව් නොකිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත අංක 14 හි 25 වගන්තිය අනුව සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කල යුතු වුවත් අධිකාරියට අනුයුක්තව රාජකාරි ඉටු කරනු ලබන ත්‍රිවිධ හමුදා සහ පොලිස් සාමාජිකයන් පිළිබඳ කිසිදු තොරතුරක් මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරව් කර නොතිබුණි. | 2023 වර්ෂය අවසාන වන විටදී අධිකාරියෙහි රාජකාරි සිදු කිරීම සඳහා ත්‍රිවිධ හමුදාවේ, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සහ පොලිසියේ නිලධාරීන් 55 දෙනෙකු අනුයුක්තව රාජකාරි සිදු කරති. ඉදිරියෙදි එවැනි අඩුපාඩු ඇති නොවන්නට කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කර ඇති බව දන්වා තිබුණි. | ගිණුමකරණ ප්‍රමිත අනුව තොරතුරු අනාවරණය කළ යුතු වීම. |

## 1.8 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 264 සහ 138 (3) (4) (5)(6) | සියළුම ගෙවීම් වෙනුවෙන් විධිමත් කුවිතාන්සි/බිල්පත් වවුචරයට අමුණා තිබිය යුතු වුවත් එම නියමයන්ගෙන් බැහැරව රණවිරු දිනය සැමරීම වෙනුවෙන් එකතුව රු.1,752,065 ක් වූ සංග්‍රහ වියදම් වලට අදාළ වවුචර් 06 ක අවිධිමත් ලෙස අමුණා තිබූ කුවිතාන්සි සහ බිල්පත් වල ඡායා පිටපත් මත අදාළ මුදල් ගෙවීම් සිදු කර තිබුණි. | මුදල් ගෙවීමේ දී ගෙවීම් වවුචරවලට මුදල් රෙගුලාසි අනුව අමුණා තැබිය යුතු සියලුම ලේඛන අමුණා ඇති බව තහවුරු කර ගැනීමෙන් පසු පමණක් අදාළ ගෙවීම සිදු කරන ලෙස ගිණුම් අංශයේ නිලධාරින්ට උපදෙස් දෙන ලද බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි අනුව වවුචර් අනුමැතිය, සහතික කිරීම සහ ගෙවීම කළ යුතු වීම. |
| (ආ) මුදල් රෙගුලාසි 137 (5) | ගෙවීම් වලට අදාළව වවුචර් අනුමත කිරීමේදී ඒවා පරීක්ෂා කොට නිවැරදි ලෙස භාරගෙන තිබෙන බවට සෑහීමකට පත්වීමෙන් අනතුරුව වවුචර් අනුමත කල යුතු වුවත් එයින් බැහැරව රණවිරු සේවා අධිකාරිය විසින් රණවිරු දිනය වෙනුවෙන් සංග්‍රහ වියදම් සඳහා ලයිට් හවුස් ගැලේ ආයතනයට රු.200,000 ක මුදලක් අදාල සැපයුම් ලබා ගැනීමට පෙර අත්තිකාරම් ලෙස අනුමත කර ගෙවා තිබුණි. | ත්‍රිවිධ හමුදාව හා පොලිසිය සමඟ එක්ව වාර්ෂිකව ජාතික රණවිරු අනුස්මරණ දින උත්සවය සංවිධානය කරනු ලැබේ. මෙම උත්සවයේ විශේෂ ආරාධිත අමුත්තන්ට හා රණවිරු ඥාතීන් ඇතුලු 400 දෙනෙකු සඳහා කෙටි ආහාර පැකට් නාවික හමුදාවේ ලයිට් හවුස් ගැලේ වෙතින් මිලදී ගැනීමට ඇණවුම් ලබාදුන් අතර එම ආයතනයේ ඉල්ලීම මත රු. 200,000 ක මුදලක් අත්තිකාරම් වශයෙන් ලබා දුන් බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු බව. |
| (ඇ) මුදල් රෙගුලාසි 104 (4) | අලාභ හානිය සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුලතදී පූර්ණ වාර්තාව ඉදිරිපත් කල යුතු වුවත්, 2023 පෙබරවාරි 03 දින වායු සමීකරන යන්ත්‍ර දෙකක රු.110,833 ක් වටිනා තඹ බට සොරා ගැනීමට අදාල පරීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි. | පොලීසිය විසින් පරීක්ෂණයක් සිදු කරගෙන යනු ලබන අතර ආයතනික වශයෙන් මු.රෙ.104 යටතේ පරීක්ෂණයක් සිදු කිරීම සඳහා පත්කළ කමිටුවේ වාර්තාව ලැබී ඇති අතර, කළමනාකරණ මණ්ඩලයේ උපදෙස් අනුව කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 1999 අංක 54 දරණ රණවිරු සේවා අධිකාරි පනතෙහි 06 වන වගන්තිය | පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දින සිට දින 60 ක් ඇතුලත ක්‍රියාන්විතයේදී ආබාධිත, මියගිය හෝ සොයාගත නොහැකි සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සියළු සාමාජිකයින් හා ඔවුන්ගේ යැපෙන්නන් පිළිබද නාම ලේඛණයක් සැකසිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම නම් ඇතුලත් සම්පූර්ණ තෙරතුරු පද්ධතියක් ස්ථාපිත කර නොතිබුණි. | ක්‍රියාන්විත හේතුන් මත මියගිය, අතුරුදහන් සහ ආබාධිත රණවිරුවන්ගේ මූලික තොරතුරු ඇතුළත් කරමින් රණවිරුවන්ගේ සේවා අංක මූලික කරගෙන දත්ත පද්ධතියේ තොරතුරු යාවත්කාලින කර ඇත. එම රණවිරුවන්ගේ ළඟම ඥාතීන්ගේ තොරතුරු ද යාවත්කාලීන කිරීම් සිදු කරන අතර, මෙම තොරතුරු වලට අමතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ග්‍රාම නිළධාරින් හරහා තොරතුරු මේ වන විට ලබා ගනිමින් පවතී. | 1999 අංක 54 දරණ රණවිරු සේවා පනත අනුව කටයුතු කළ යුතු වීම. |
| (ඉ) 2018 ජනවාරි 24 දිනැති, රාජ්‍ය පරිපාලන හා කළමණාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ අංක 02/2018 දරණ “රාජ්‍ය අංශය තුළ මානව සම්පත් සංවර්ධනය කිරීම පිළිබඳව නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | රාජ්‍ය ආයතනයන්හි සේවයේ නියුතු කාර්ය මණ්ඩලයන්ගේ කාර්යසාධනය ඇගයීම සඳහා, 2018 වර්ෂයේ සිට සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂිකව කාර්යසාධන ගිවිසුම් අත්සන් කළ යුතු බව දැනුවත් කර තිබූ නමුත්, රණවිරු සේවා අධිකාරිය විසින් වාර්ෂිකව කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. එමෙන්ම මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර ක්‍රියාක්මක කළ යුතු වුවද අධිකාරිය විසින් එම සැලැස්ම ද සකස් කර නොතිබුණි. | අධිකාරියේ කටයුතු අඛණ්ඩව හා කාර්යක්ෂමව සිදු කිරීම සඳහා දැනට සිටින 115 දෙනාගෙන් (ස්ථිර 57, අනුයුක්ත 59) යුතු කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවන බව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත දැන්වීමෙන් පසුව අධිකාරියේ කාර්ය මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කරන ලෙස දන්වන ලදී. ඒ අනුව අධිකාරිය සඳහා 182ක කාර්ය මණ්ඩලයක අවශ්‍යතාවයක් පවතින බව හඳුනාගන්නා ලදී. එම පුරප්පාඩු පිරවීමෙන් පසු 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය අංශය තුළ මානව සම්පත් සංවර්ධනය කිරීම පිළිබඳව නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනය අනුව කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | චක්‍රලේඛයට අනුව කටයුතු කළ යුතු වීම. |

**1.9 මුදල් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 නොවැම්බර් 01 දින කෙටිකාලීන ආයෝජනයක් ලෙස දින හතේ ඇමතුම් (Seven Days Call Deposit) තැන්පතුවක් ලෙස රු.1,500,000 ක මුදලක් ලංකා බැංකුවේ තැන්පත් කර සමාලෝචිත වර්ෂය අවසන් වන විට වසර 05 කට අධික කාලයක් ගත වී ඇතත් මෙම ආයෝජනය නැවත අළුත් කිරීමට හා එයට අදාළ පොලිය ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම තැම්පතුවේ පොළී ආදායම තැම්පතුව ඉවත්කරන අවස්ථාවේ දී ලබා දෙන අතර වාර්ෂිකව පොළී ආදායම හඳුනා ගැනීම සිදු කල නොහැක. මෙම තැම්පතුව පිළිබඳ අධිකාරියේ ආයෝජන කමිටුව වෙත වාර්තා කර ලබා දෙනු ලබන නිර්දේශය කළමනාකරණ මණ්ඩලය වෙතද යොමු කර ලබා දෙන තීරණය අනුව කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | රජයේ මුදල් උපරිම ඵලදායකත්වයක් සහිතව ආයෝජනය කළ යුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 245,654,689 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 121,972,695 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 123,681,994 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව ලොතරැයි ආදායම රු 140,555,624 ක්ද ස්ථාවර තැන්පතු පොලී ආදයම රු.16,684,455 ක්ද හා පරිත්‍යාග ලැබීම් රු 4,077,028 කින්ද වැඩි වීම මෙම වර්ධනයට හේතු වී තිබිණි. නමුත් 2023 වර්ෂයට අදාල රු.270,381,736 ක මුළු ලොතරැයි ආදායම සමාලෝචිත වර්ෂයේදී මුදලින් ලැබී නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)2014 වර්ෂයේදී අධිකාරියෙහි ප්‍රධාන කාර්යාලයෙහි සිදු කරන ලද ක්ලැඩින් සවිකිරීම සම්බන්ධ රු. 4,481,269 ක් වූ ගනුදෙනුවට අදාල අක්‍රමිකතා පිළිබඳ විමර්ශනයක් සිදුකර ඇතත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් වගකිවයුතු පුද්ගලයන් හඳුනාගෙන නොතිබුණි. | අක්‍රමිකතාවයක් අනාවරණය වීමෙන් පසු මේ පිළිබඳව විමර්ශනය අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිසමට භාර දී ඇති අතර අදාළ විමර්ශන කටයුතු සිදු කරගෙන යනු ලැබේ. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශය අනුව පරීක්ෂණයක් සිදු කිරිම සඳහා කමිටුවක් පත්කර ඇති අතර, නිලධාරීන් 14 දෙනාගෙන් 6 දෙනෙකුගෙන් ප්‍රකාශ ලබාගෙන ඇති බවත්, තවත් නිලධාරින් 08 දෙනෙකුගේ ප්‍රකාශ ලබා ගැනිමට තිබෙන බවත්, කමිටුව විසින් දන්වා ඇත. | වගකිව යුත්තන් හඳුනාගෙන පාඩුව අයකර ගත යුතු වීම. |
| (ආ) 2009 වර්ෂයේදී රණවිරු සේවා අධිකාරියට පරිත්‍යාග ලෙස ලද තක්සේරු වටිනාකම රු.26,703,250 ක් වූ අකුරැස්ස , | මෙම ඉඩම සංවර්ධනය කර රණවිරු මව්වරුන්ගෙන් සමන්විත වැඩිහිටි නිවාසයක් අධිකාරිය විසින් 2018.09.14 දින ආරම්භ කල අතර වැඩිහිටියන් | අරමුණු වලට අනුකූලව වත්කම් උපයෝජනය කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| යාකබැද්ද රණවිරු සුරක්ෂා මැදුර පිහිටි අක්කර 2කට ආසන්න ඉඩම උපයෝජනය සඳහා යෙදවිය යුතු අරමුණු වලින් බැහැරව ශ්‍රී ලංකා සේවා මුක්ත භට සංගමය වෙත ලබාදී තිබුණි. | තිදෙනෙකු නේවාසික පහසුකම් ලබා ගත් අතර 2019 ඔක්තෝබර් මාසයේදී ඔවුන් සියලු දෙනාම ඉවත්ව ඇත. ආරක්ෂක ලේකම්තුමාගේ උපදෙස් පරිදි මෙම දේපල යුධ හමුදා සේවා මුක්ත භට සංගමයට 2020.12.15 දින සිට ගිවිසුමක් මගින් වසර තුනකට පවරා දුන් අතර, එම කාලය 2023.12.15 දිනෙන් අවසන්ව ඇති බව දන්වා තිබුණි. | |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) විශ්ව විද්‍යාල, විද්‍යාපීඨ හා රජයේ අනුමත උසස් අධ්‍යාපන ආයතන වල අභ්‍යන්තර ශිෂ්‍යයකු ලෙස නොමිලේ අධ්‍යාපනය ලැබීමට තේරී පත් වූ රණවිරුවන්ගේ දරුවන් වෙනුවෙන් මසකට රු 3,000 බැගින් උපරිම මාසික වාරික 48 ක් ගෙවීම සඳහා උසස් අධ්‍යාපන ශිෂ්‍යාධාර ව්‍යාපෘතිය 2012 වර්ෂය දී හඳුන්වා දී තිබුණි. එහෙත් ඊට පටහැනිව ගාස්තු ගෙවා අධ්‍යාපනය ලබන කොතලාවල ආරක්ෂක සේවා විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයන් 24 දෙනකු සඳහා 2021 ජනවාරි සිට වාරික 244 ක් සඳහා රු 732,000 ක් අධිකාරිය විසින් ගෙවා තිබුණි. | අපොස උසස් පෙළ සාර්ථකව සමත් වී එහි ප්‍රතිඵල මත විශ්ව විද්‍යාල , විද්‍යාපීඨ හා රජයේ අනුමත උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යාපනය හැදෑරීමට තේරිපත් වූ රණවිරු දරුවන් වෙනුවෙන් සහයවීමේ අරමුණින් 2012 වර්ෂයේ දී උසස් අධ්‍යාපන ශිෂ්‍යාධාර ලබා දිමේ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි. මෙම ව්‍යාපෘතියේ නිර්ණායක 2021 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සංශෝධනය කරන ලද බව දන්වා තිබුණි. ඒ අනුව කොතලාවල ආරක්ෂක සේවා විශ්ව විද්‍යාලයේ පාඨමාලා ගාස්තු ගෙවා අධ්‍යාපනය හදාරන රණවිරු දරුවන්ට ද මෙම අධ්‍යාපන ශිෂ්‍යාධාර ලබා දිම නිර්ණායකවලට අනුකූල බව දන්වා තිබුණි. | ශිෂ්‍යාධාර ලබාදීමේ අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගත යුතුයි. |
| (ආ)ආරක්ෂක අමාත්‍යාංශයේ අංක MOD/01/2021 හා 2021 මැයි 12 දිනැති චක්‍රලේඛය අනුව 2021 අප්‍රේල් 27 දින සිට ක්‍රියාත්මක වන පරිදි රණවිරුවන්ගේ වයස අවුරුදු 55 සම්පූර්ණ වීමෙන් පසු ස්ථාවර මාසික දීමනාවක් ලෙස රු.25,000 ක් 2009 මැයි 19 දිනට පෙර සේවයේ යෙදී සිටියදී මියගිය හෝ අතුරුදන් වූ රණවිරුවන්ගේ දෙමාපියන් සඳහා හිමිකම් පවතින බැවින් අධිකාරිය විසින් ගෙවනු ලබන මාපිය සුරුකුම් දීමනාව ගෙවීම් සිදු නොකල යුතු බව සඳහන් වේ. එසේ වුවද | මෙම චක්‍රලේඛය සන්නිවේදනය විමේදී සිදු වී ඇති ප්‍රමාද දෝෂයක් හේතුවෙන් රණවිරු සේවා අධිකාරිය විසින් මෙම චක්‍රලේඛය පිළිබඳව දැනුවත් වන ලද්දේ 2023 ජනවාරි මාසයේ දිය. ඒවන විටත් මාපිය සුරැකුම් දිමනාව ලබමින් සිටි රණවිරු දෙමව්පියන්ගෙන් 26 දෙනෙකු **(රණවිරුවාගේ වයස අවුරුදු 55 සම්පූර්ණ විම නිසා)** මෙම චක්‍රලේඛය අනුව ප්‍රතිලාභ ලැබිමට හිමිකම් නොලබන බව අනාවරණය කර ගැනිමෙන් පසු ඔවුන් වෙත මෙම දිමනාව ගෙවීම 2023 ජනවාරි මස සිට නතර කරන ලදි. 2023 ජනවාරි | පවත්නා නීතියට යටත්ව රණවිරු දීමනා ගෙවීමට කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| රණවිරුවාගේ වයස අවුරුදු 55 සම්පූර්ණ වීමෙන් පසුවද අධිකාරිය විසින් පුද්ගලයින් 26 ක් වෙනුවෙන් මාස 02 ත් මාස 19 ත් වූ කාලයක් සඳහා රු.711,000ක මාපිය සුරැකුම් දීමනාව වැඩියෙන් ගෙවා තිබුණි. | මාසයේ සිට අදාළ චක්‍රලේඛය අනුව මාපිය සුරැකුම් දීමනාව ගෙවනු ලබන බව දන්වා තිබුණි. | |

## 3.3 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)අධිකාරියේ ප්‍රධාන ආදායම් ප්‍රභවය ලෙස ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ පවතින ඉතිරි කිරීමේ ගිණුම තුල 2022 සහ 2023 වර්ෂවලදී ලැබී තිබූ රු.7,358,875 ක ස්ථාවර තැන්පතු පොලී ආදායම හා එම පොලිය මත ලද රු.323,865 ක් වූ ඉතුරුම් පොලී ආදායම් ඵලදායී උපයෝජනයකින් තොරව රඳවාගෙන තිබුණි. | ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ අංක 100010885550 දරන ඉතිරි කිරීමේ ගිණුමට සහ මහජන බැංකුවේ අංක 259200160007849 දරණ ඉතිරි කිරීමේ ගිණුමට, එම බැංකුවල පවත්වාගෙන යනු ලබන ස්ථාවර තැන්පතුවල පොළී ආදායම බැර කරනු ලැබේ. භාණ්ඩාගාරය විසින් ලොතරැයි මණ්ඩල පැවරුම් නියමිත පරිදි ලබා නොදෙන බැවින් ද අයවැය ප්‍රතිපාදන නිසි පරිදි ලබා නොදෙන බැවින්ද රණවිරු සුභසාධන වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා මෙම මුදල් ඉතිරි කිරීමේ ගිණුම්වලම රදවා ගන්නා ලද බව දන්වා තිබුණි. | මුදල් උපරිම ඵලදායිතාවයක් සහිතව උපයෝජනය කළ යුතු වීම. |

## 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2001 වර්ෂයේදී අධිකාරිය වෙත පරිත්‍යාග වශයෙන් ලද රු.1,500,000 ක් වටිනා අක්කර 1 රූඩ් 1 පර්චස් 29 ක කිරල මැද කුඹුර යන ඉඩම සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් උපයෝජනයකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. | මෙම ඉඩම රණවිරුවන් වෙත බෙදා දීම සඳහා සුදුසු තත්වයක නොතිබුණු බැවින්, ඉඩම පිළිබඳව ගලහිටියාව ගොවිජන සේවා මධ්‍යස්ථානය විසින් වී වගාව සඳහා යොදා ගැනිමට සුදුසු තත්වයේ පවතින බව වාර්තා කර ඇත. අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් මෙම ඉඩම සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත පැවරිමට අනුමැතිය ලබා දෙන ලදී. අදාළ ඉඩම භාරගන්නා ලෙස සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත. | අරමුණු අනුව ඵලදායීව වත්කම් පරිහරණය කළ යුතුය. |